ආඛ්‍යාන narrations
**Volume 01 | Issue 01 | January – June 2016 | Article 06**
**ISBN 2478-0642**

On-line Refereed Journal of the Center for Indigenous Knowledge and Community Studies
Sabaragamuwa University of Sri Lanka

Follow this and additional works at: www.sab.ac.lk
e-mail: akyanaeditor@ssl.sab.ac.lk

**Recommended Citation**
පෙරේරා, ඇලෙක්ස් (2016) "“ආදිවාසී” සංකල්පය හඳුනා ගැනීම: ගෝලීය හා ශ්‍රී ලාංකික දෘෂ්ටීන් හා කතිකාවත්," *ආඛ්‍යාන:* : Vol. 01: Iss. 1, Article 07.
Available at: www.sab.ac.lk

**ශාස්ත්‍රීය ලිපි**

# “ආදිවාසී” සංකල්පය හඳුනා ගැනීම: ගෝලීය හා ශ්‍රී ලාංකික දෘෂ්ටීන් හා කතිකාවත්

ඇලෙක්ස් පෙරේරා



# "ආදිවාසී" සංකල්පය හඳුනා ගැනීම: ගෝලීය හා ශ්‍රී ලාංකික දෘෂ්ටීන් හා කතිකාවත්

ඇලෙක්ස් පෙරේරා
B.A(sp), M.A, PhD
alex.gperera@gmail.com

ආදිවාසී (indigenous) යන්න බොහෝ අය සඳහා යෙදෙයි. ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂයට අනුව එය පුද්ගලයින් සඳහා පමණක් නොව ඕනෑ ම දෙයක් කිසියම් භූමි ප්‍රදේශයක පැහැදිලි ව කිව නොහැකි කාලයක පටන් පවතින්නේ නම් එය ආදිවාසී නොහොත් ස්වදේශීය (indigenous) වෙයි . වර්තමාන සිවිල් සමාජයට පෙර පැවති සමාජ ආදි සමාජ (archic societies) ලෙස ද ප්‍රාථමික සමාජ (primitive societies) ලෙස ද හැඳින්විය හැකි ය. මෙකල පවා ආසියානු අප්‍රිකානු රටවල ප්‍රාථමික සමාජ පවතියි. උතුරු හා දකුණු ඇමරිකාවේ වසන ස්වදේශීය ඇමරිකානුවෝ (native Americans) ද ප්‍රාථමික ගණයෙහි ලා සලකනු ලබති. ප්‍රාථමික සමාජ වනචාරී සමාජ (savage societies) ලෙස හැඳින්වූයේ මැලිනොවුස්කි (Malinowski) නම් මානව විද්‍යාඥයා විසිනි. මෙම සමාජ ප්‍රාග් ලිඛිත (pre-literate) හා ප්‍රාග් කාර්මික (pre-industrial) ආදි වශයෙන් ද, මානව විද්‍යාඥයින් විසින් සමහර අවස්ථාවල හඳුන්වා ඇති බව පෙරේරා (Perera, 2007:59) පෙන්වා දෙයි.

ආදිවාසීන් ඔවුන්ගේ භූමියකට හිමිකම් කියන්නේ ඔවුන් සහ ඔවුන්ගේ පරපුර එම ආදල භූමිය පිළිබඳ ඓතිහාසික මතකයට එහා කල සිට ජීවත් වන නිසා ය. එම කණ්ඩායම් තමන්ට වඩා වාර්ගික ලෙස ජාතික ලෙස හා සංස්කෘතික ලෙස වෙනස් පිරිස් විසින් යටත් කර ගනු ලැබූ අතර, එමගින් ඔවුන් දැඩි පීඩාවකට පත් කොට ඇත. වෙනත් රාජ්‍යයක් විසින් මෙම සවදේශික ජනතාව යටත්කොට ගෙන, ඔවුන් එම රාජ්‍ය සමග සංස්ථාගත තත්වයකට පත් කොට ඇති අතර, එම රාජ්‍ය විසින් මෙම ස්වදේශීය ජනතාව පිටස්තරයන් හා බොහෝ අවස්ථාවල හීන කණ්ඩායම් ලෙස සලකනු ලබන බව ලුවිස්ගේ (Lewis, 1997:9) අදහස යි.

විශේෂයෙන් ම අප්‍රිකාවේ ආදීවාසී ජනතාව සහ අනෙකුත් ජනවාර්ගික කණ්ඩයම් අතර වෙනස්කම් හඳුනා ගැනීම අපහසු තරම් ය. සමහර අප්‍රිකානු ජන කණ්ඩායම් තම රටේදී ම අන් අය විසින් පිටස්තරයන් ලෙස සලකනු ලැබේ. විශේෂයෙන් ම ඔවුන්, සෑන් (san) සහ ඔවුන් හා සම්බන්ධ කලහාරි කාන්තාරයේ කණ්ඩායම් වන බුෂ්මන් ද (bushmen) සයිරේ හි ඉටුරි වැසි වනාන්තරවල වෙසෙන ඊෆ් (eif) මෙන් ම ඔවුන් හා සම්බන්ධ පිග්මි (pigmi) ගෝත්‍රිකයන් ද අප්‍රිකාවේ සැරිසරන සල ගෝත්‍රිකයින් (nomands) ද මෙසේ පිටස්තරයන් ලෙස සලකනු ලැබේ. නිර්වචනය කිරීම අපහසු වුව ද ලෝක ආදීවාසී ජනකොටස් ලෝක ජනගහනයෙන් 5% ක් වෙති (https://www.culturalsurvival.org 30.06.20166).

ලුවිස්ට අනුව (Lewis, 1997:10-11) මහාද්වීපවල අධිරාජ්‍ය විසින් ආන්තික කරනු ලැබ සිටින මෙම ආදිවාසී පිරිස් බොහෝ පීඩාවලට ලක් ව තමන්ට හිමි බිම්වලින් තව තවත් ඈතට තෙරපෙමින් සිටීම අද ලෝක යථාර්ථයක් වී ඇති අතර මේ නිසා ම මෙම පිරිස් එක්සත් ජාතීන්ගේ සංවිධානය තුළ තමන් වෙනුවෙන් හඬක් ඉල්ලා සිටිති. ලෝක ආදිවාසීහු තමන් සතු විවිධ නෛසර්ගික ලක්ෂණ හේතුකොට ගෙන විශේෂ කණ්ඩායම් ලෙස නිර්වචනට භාජනය වෙති. තමන් ජීවත්වන රාජ්‍යයට බෙහෙවින් ම සීමා වී සිටින මොවුහු ගෝත්‍රික ලක්ෂණවලින් යුක්ත වෙති (Lewis, 1997:54-55).

ලෝක ආදිවාසී ප්‍රජාව තම ප්‍රශ්න පිළිබඳ ව එක්සත් ජාතීන්ගේ සංවිධානය අවධි කොට ඇති අතර, පහත කරුණු සම්බන්ධයෙන් සංවිධානයේ අවධානය යොමු කරඇති ආකාරය පෙන්වා දෙන ලුවිස් එම කරුණු මෙසේ පෙළගස්වයි .

- තමන් ජීවත්වන ප්‍රදේශවල ස්වයං තීරණ අයිතිය තහවුරු කර ගැනීම.
- ජන සංහාරයට විරුද්ධ ව ආරක්‍ෂාව.
- ජනවර්ග සංහාරයට එරෙහිව ආරක්‍ෂාව.
- තමන්ට ම අනන්‍ය වූ ආයතන හා පාලනයන් පවත්වාගෙන යාමට ඇති අයිතිය රැකගැනීම.
- තම සංස්කෘතීන් ආරක්ෂා කරගැනීමේ අයිතිය.
- තමන් ජීවත්වන භූමියට ඔවුන්ගේ අයිතිය හා සබැඳියාව රැකගැනීමේ අයිතිය තහවුරු ගැනීම.
- තම සාම්ප්‍රදායික ආර්ථික ක්‍රියාකාරකම් රැකගැනීම.
- තමන් පිළිබද තීරණ ගන්නා සැම ලෝක සංවිධානයක ම තම නියෝජිතත්වය තහවුරු කර ගැනීම (1997:56-57).

මැක්ස් ග්ලක්මාන් (Max Gluckman) නැමැති මානව විද්‍යාඥයා විසින් ප්‍රාථමික සමාජ ගෝත්‍රික සමාජ ලෙස හඳුන්වන ලද අතර, (Gluckman,1965:68-78) මේ වනවිට ප්‍රාථමික සමාජ යන යෙදුම පාවිච්චි නොකළ යුතු යැයි මානව විද්‍යාඥයින් අතර මතයක් ගොඩනැගෙමින් පැවතිණි. එවාන්ස් ප්‍රිචාර්ඩ් (Evans Prichard) නම් මානව විද්‍යාඥයා ප්‍රාථමික සමාජ යන යෙදුමට එතරම් කැමැත්තක් නොදක්වයි. මෙම යෙදුම මානව විද්‍යාවේ කලක් භාවිත වුවද එම ප්‍රාථමික සමාජ ලෙස හඳුන්වනු ලබන ජන සමාජ සමහර අංශවලින් නූතන සමාජවලට වඩා ඉදිරියෙන් සිටින නිසා එවා ප්‍රාථමික සමාජ ලෙස හැඳින්වීම යුක්ති යුක්ත නො වේ (Prichard, 1992). මේ සියලු කරුණු සැලකිල්ලට ගන්නා මානව විද්‍යාඥයෝ පසුකාලීන ව මෙම ගෝත්‍ර සමාජ ආදිවාසී සමාජ ලෙස නම් කිරීමට යුහුසුලු වූහ. මෙම ආදිවාසී සමාජ (indigenous societies) නොහොත් ස්වදේශීය සමාජ ගණයට මතක ඇති කාලයකට (immemoral) පෙර සිට පැවත එන ජනතාව ගොනු කළ ද මෙම යෙදුමට අනුව ගෝත්‍ර සමාජ පමණක් නොව, සාම්ප්‍රදයික ගැමි සමාජ ද අයත් වන බවත් ඒ හේතුව නිසා ම ආදි ජන කණ්ඩායම් ගෝත්‍ර සමාජ ලෙස හැඳින්වීම වඩාත් සුදුසු බවත් පෙරේරා (2007:60) තවදුරටත් පෙන්වා දෙයි. නූතන ආර්ථික මිනුම් දඬු ඔස්සේ ආදිවාසි සමාජවල ආර්ථිකයන් හඳුනාගැනිම හෝ තේරුම්ගැනීම අසීරු වෙයි. එයට හේතුව ඔවුන්ගේ ආර්ථික ක්‍රම හා තාක්ෂණය ඉතා සරලවීම යි (Firth, 1959). දැනට දියුණු සමාජ ක්‍රම පවා වේගවත් ආර්ථික ගමනක ගොස් වෙහෙසට පත් ව යථායෝග්‍ය තාක්ෂණය (appropriate technology) සොයා යනු දැකිය හැකි ය. මෙම යථායොග්‍ය තාක්ෂණය බෙහෙවින් ම ගෝත්‍රික ජනතාව පරිසරය හා සබැඳියාව සකසා ගන්නා තාක්ෂණයට සමානකමක් දරයි. විධිමත් සාහිත්‍යයක් කලාවක් හෝ ආගමක් නොමැතිවීම ද ගෝත්‍රික නොහොත් ආදිවාසි සමාජවල ලක්ෂණයක් බව රෙඩ්ෆීල්ඩ් (Redfield,1947:231) ගේ තර්කය යි. එක්සත් ජාතින්ගේ සංවිධානය මගින් ද ආදිවාසී (indigenous) යන්නට විශේෂ නිර්වචනයක්

This work is licensed under a Creative Commons Attribution-NonCommercial-NoDerivatives 4.0 International License..

සපයා නොමැති අතර, මෙම යෙදුම සම්බන්ධයෙන් පොදු එකඟතාවක් හෙවත් තෙරුම් ගැනීමක් ගොඩ නඟා ඇත. ඒ අනුව ආදිවාසී යන්න මෙසේ හඳුනා ගත හැකි ය.

- තම ප්‍රජාව විසින් හඳුනාගන්නා ලදුව, පෞද්ගලික මට්ටමේදී ආදිවාසී යැයි ස්වං හඳුනා ගැනීමක් කරනු ලබන පුද්ගලයින් හා කණ්ඩායම් වීම.
- පූර්ව යටත් විජිත හෝ /හා පූර්ව සංක්‍රමණික කණ්ඩායම්වලට පෙර සිට පැමිණෙන ඓතිහාසික අඛණ්ඩතාව.
- අවට පවතින ස්වාභාවික සම්පත් සහ වාසය කරන ප්‍රදේශ හා ඇති දැඩි සබැඳියාව.
- තම කණ්ඩායමට ආවේණික ව පවතින පැහැදිලි සමාජ ආර්ථික හා පාලන ක්‍රම සහිතවීම.
- පැහැදිළි ලෙස දැකිය හැකි භාෂාවක් හා සංස්කෘතික විශ්වාසවලින් යුක්ත වීම.
- විවිධ ආර්ථික සමාජ අවශ්‍යතා සඳහා තම සමාජය තුළ බලහත්කාරයෙන් තොර ව (අධිකාරී බලයෙන් තොර ව ) කණ්ඩායම් ගොඩ නඟා ගැනීම.
- තම පරම්පරා උරුමයෙන් ලැබී ඇති පරිසරය සහ පද්ධතීන් ප්‍රති උත්පාදනය කිරීම හා නඩත්තු කිරීම අරබයා සම්මතයක් පැවතීම (UNPFII,2007 :1).

**ආදිවාසී අනන්‍යතාව පිළිබඳ ගැටලුව**

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අදහසට අනුව බෙහෙවින් අර්ථාන්විත වූ යොමුව ලෙස දැක්වන්නේ ආදිවාසීන් නිර්වචනය කිරීමට වඩා හඳුනා ගැනීමට සුදුසු බව යග මෙම හඳුනාගැනීම එක්සත් ජාතීන්ගේ සංවිධානය සතු බොහෝ මානව හිමිකම් ලියැවිලි දක්වා ඇති ආකාරයට, ස්වයං අනන්‍යතාකරණයේ මූලික නිර්ණායක මත පදනම්වීම වැදගත් ය. මේ සම්බන්ධ පොදු හෙවත් ජාතිගත යෙදුම (generic term) ලෙස ආදිවාසී (indigenous) යන්න වසර ගණනාවක් තිස්සේ යෙදී ඇත. සමහර රටවල එම රටට ආවේණික ලෙස යොදගත් යෙදුම් ඔස්සේ මෙම ආදිවාසී නොහොත් ගෝත්‍රික ජන කොටස් හඳුන්වනු ලැබෙති. එනම්, ගෝත්‍ර ජනයා, ප්‍රථම ජනතාව (first peoples/nations), ඇබෝරිජිනීස් (aborigines) ආදිවාසී (adivasi) ජනජාති (janajati) වන්නියලැත්තෝ හෙවත් වැද්දේ (veddas) ආදී යෙදුම් ද භූගෝලවිද්‍යාත්මක දෘෂ්ටියෙන් බලා දඩයම් හා රැස්කරන්නන් (hunter-gatherers) සල ගෝත්‍රිකයින් (nomads) පිටිසර කණ්ඩායම් (peasants) කඳුකර ජනතාව (hill people) යනුවෙන් ද ආදිවාසී ජනතාව හඳුන්වනු ලැබෙති (UNPFII,2007:1).

1980 ගණන්වල සිට ආදිවාසී යන්න එහි විශේෂිත ආනුභාවික විමසුමකින් යුතු ව භාවිත වන්නට විය. එයට ඥනය (Knowledge) යන වචනය ද එක්වීම නිසා ආදිවාසී ඥනය සොයා යාමට බොහෝ ආදිවාසී නොවන කණ්ඩායම් හා පුද්ගලයෝ යුහුසුළු වූහ. එය දර්ශනික හා විශේෂයෙන් ම සමාජ විද්‍යාත්මක අර්ථයෙන් මතවාදී තත්වයකට පත්වීම ඇරඹිණි. යුරෝපා ව්‍යාප්ත වාදය තුළ බල සබඳතා (Power relations) අරබයා ඥනය ඉටු කළ මෙහෙය සුවිශේෂී විය. ඉහතින් සඳහන් කළ සමාජවිද්‍යාත්මක හා දර්ශනික මතවාදයන් මත පිහිටා සිටි ඥන ගවේශණය නිසා ආදිවාසී ඥන ගවේශනයට ද මං පෙත් හෙළි පෙහෙළි වූ බවට පර්වෙල් (Purcell, 1998: 258-272) කරුණු ගෙන හැර දක්වයි.

1994-2004 ආදිවාසී දශකය ලෙස නම්කොට තිබිණි (UNHR,n.d.:2). මේ පිළිබඳ වූ කතිකාවල සඳහන් වන්නේ මෙම දශකය තුළ ප්‍රායෝගික ක්‍රියාකරකම් ඉතා සුළු ප්‍රමාණයක් සිදුවී ඇති බවත් ආදිවාසීන්ට මුහුණ දීමට සිදුවී ඇති තර්ජන අඩුවෙනවාට වඩා වැඩි දියුණු වී ඇති බවත් ය. මේ සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගැනීමට නම්, එක්සත් ජාතීන්ගේ සංවිධානයට අමතරව වෙනත් ලෝක සංවිධාන විසින් ආදිවාසීන් හඳුනාගෙන ඇති ආකාරය විමසිය යුතු වෙයි. ජාත්‍යන්තර කම්කරු සංවිධානය ආදිවාසීන් හඳුනා ගත්තේ මෙසේ ය. 'රටක ජාතික ප්‍රජාවන් සමාජයීය, සංස්කෘතික හා ආර්ථික තත්වයන්ගෙන් වෙනස්වූ ලක්‍ෂණ හිමි ගෝත්‍රික ජන කොටස් මෙන් ම පාරම්පරික මුල් පදිංචිකරුවන්ගෙන් පැවත එන සිරිත් විරිත් සම්ප්‍රදයයන් හා අනන්‍යතාව රැකෙන ලෙස ජීවත්වන එම පරම්පරාවට අයත් ජන කොටස් ආදිවාසීන් ලෙස සැලකෙයි (Convention No. 169 n.d.10.06.2016).

ලෝක බැංකුව විසින් ආදිවාසීන් ලෙස පිළිගනු ලබන්නේ පහත සඳහන් ලක්‍ෂණයන්ගෙන් යුත් ජන කොටස් ය.

- ආදිවාසීන් ලෙස ස්වයං අනන්‍යතාවක් ලබා තිබීම හා එම අනන්‍යතාව අන් අය විසින් පිළිගෙන තිබීම.
- ප්‍රදේශයේ පාරම්පරික උරුමයන්ට හා ස්වාභාවික සම්පත්වලට බැඳියාවක් හා ළැදියාවක් තිබීම.
- වෙනස්වූ සංස්කෘතික සමාජයකට අයත්වන අනෙකුත් ජන කොටස්වලින් පැහැදිලි ව වෙන්කොට හඳුනා ගැනීම.
- ජාතික භාෂාවට වෙනස් වූ ආදිවාසී ගෝත්‍රික භාෂාවක් ව්‍යවහාර කිරීම (http://siteresources.worldbank.org 02.06.2016)

1983 දී ආදිවාසී ජනයා පිළිබඳ ක්‍රියාකාරි කමිටුව (Working Group of Indigenous Peoples) විසින් එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් කරන ලද ආදිවාසීන් පිළිබඳ නිර්වචනය පුළුල් තලයකට ගෙන යන ලදී. එය පහත සඳහන් පරිදි වෙයි.

- වෙනත් සංස්කෘතින්ට අයත් කාණ්ඩ හෝ ජන වර්ග කණ්ඩායම් තත් ප්‍රදේශයට පැමිණීමට බොහෝ කාලයක පෙර සිට ම එම භූමි ප්‍රදේශයේ ජීවත් වූ පැරැණ්නන්ගෙන් පැවත එන පිරිසක් වීම.
- ආදිවාසී වශයෙන් (හෝ ස්වදේශීය වශයෙන්) හඳුනාගෙන ඇති සිරිත් හා සම්ප්‍රදයයන් අන් ඒවා සමඟ මුසු නොවුණු ආකාරයට පවත්වාගෙන හා රැකගෙන රටේ අනෙකුත් (පසුව පැමිණි) ජනතාවගෙන් වෙන් ව විශේෂයෙන් ම හුදෙකලා ව ජීවත් වීම.
- ඔවුන්ගේ ජාතික සංස්කෘතික හා සමාජයීය ලක්‍ෂණවලින් පරිබාහිර වූ ලක්‍ෂණවලින් සංයුක්ත රාජ්‍ය ව්‍යුහයක් යටතේ විසීමට සිදුවීම.

1986 දී මෙයට තවත් කොටසක් එක් කරමින් යම් පුද්ගලයකු තමන් විසින් ඔහු හෝ ඇය ආදිවාසියෙකු ලෙස හඳුන්වා ගන්නේ නම්, එසේ ම අදාළ ජන කාණ්ඩය හෝ ප්‍රජාව විසින් එය පිළිගනු ලබන්නේ නම් එම පුද්ගලයා ආදිවාසියකු ලෙස සලකනු ලබන බවට සම්මතයක් ඇති විය (http://www.iwgia.org, 29.02.2016).

මේ අතර, ආදිවාසී ජනයාගේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනයේ කෙටුම්පත සැකසූ කමිටුව

This work is licensed under a Creative Commons Attribution-NonCommercial-NoDerivatives 4.0 International License..

ආදිවාසී අනන්‍යතාව පිළිබඳ කිසිදු නිර්වචනයක් ඉදිරිපත් නොකරයි. එහි සභාපතිවරිය වන එරිකා අයිරින් ඩෙයස් (Erica Iren Deas) කියා සිටියේ මෙසේ නිර්වචනයක් ඉදිරිපත් නොකිරීමට හේතුව ඓතිහාසික වශයෙන් අත් අය විසින් ආදිවාසී ජනතාව මත පටවන  නිර්වචන නිසා එම ජනතාව බෙහෙවින් වෙහෙසට පත් ව සිටීම බව ය (Lewis, 1997).

### ආදිවාසී සමාජ පිළිබඳ ලෝක දෘෂ්ටිය

ආදිවාසීබව නිරිවචනය කර ගැනීමේ දී හා ආදිවාසීන් හඳුනා ගැනීමේ දී ඔවුන්  පිළිබඳ ලෝක දෘෂ්ටිය විමසීම වැදගත් වෙයි. ඉතිහාසය පුරා  ආදිවාසී හා ආදිවාසී නොවන ජන කණ්ඩායම් එකට ගැටෙමින් මුසුවෙමින් කටයුතු කිරීමේ ක්‍රියාවලිය තුළ ලබා ඇති අත්දැකීම් සැලකිල්ලට ගන්නා විට විවිධ වෙනස්කම් සහිත දෘෂ්ටීන් ආකල්ප හා අදහස් ආදිවාසීන් සම්බන්ධයෙන් ගොඩනැගී ඇත. මෙම දෘෂ්ටීන් හා අකල්ප මතු වී ඇති සමාජවල සංස්කෘතික, ප්‍රාදේශික හා ඓතිහාසික පසුබිම් එකිනෙකට වෙනස් හා සංකීර්ණ වෙයි. එසේ ම මේ තත්වයන් හරස් සංස්කෘතික අනාවරණය (Cross–cultural exposure) හා අන්තර් සමාජීය වෙනස්වීම්වලට බඳුන් ව ඇති බව ද සැලකිය යුතු ය. මෙහිදී මුලින් ම ආදිවාසීන් තමන් පිළිබඳව දරන දෘෂ්ටිය දැන ගැනීම වැදගත් වේ. ඒ අනුව, ආදිවාසී ජනතාව තමන්ගේ ස්වෛරීභාවය පිළිබඳ තර්ජනයකට මුහුණු දී සිටිති. එසේ ම, පරිසරය හා ස්වාභාවික සම්පත්වලට විවෘතවීමට ඇති අයිතිය ඔවුන් කෙරෙන් පැහැරගෙන ඇත. උදාහරණයක් ලෙස නිවර්තන වනාන්තර  හෙළි පෙහෙළි කිරීම නිසා ස්වදේශීය ගෝත්‍ර ජනතාවගේ ස්වයංපෝෂිත ජීවන රටාවට තර්ජන එල්ලවී ඇත.  යටත් විජිතවාදී ක්‍රමවල ප්‍රතිඵලයක් ලෙස ප්‍රධාන ජනවර්ග හා සමග්‍රහණයවීම (assimilation) හෝ ස්වීකරණය පිළිබඳ ප්‍රතිපත්ති නිසා ආදිවාසී දරුවන්ගේ ආරක්ෂාවට ද තර්ජන එල්ල වී ඇත  (Jayatunge, 2009).

ආදිවාසීන් සම්බන්ධයෙන් ආදිවාසී නොවන ජනකණ්ඩායම්වල දෘෂ්ටිය මීලඟට වැදගත් වේ. මෙම දෘෂ්ටිය අනුව ආදිවාසීන්, වනචාරී (savage) ප්‍රාථමික (primitive) හෝ අශීලාචාර (uncivilized) ජන කොටස් ලෙස ම  හැඳින්වෙයි. මෙම යෙදුම් යුරෝපා යටත්විජිතවාදී ව්‍යාප්ති සමයේ දී පටබැඳුණු  ඒවා වන අතර, මේ වන විටත් ඒවා භාවිත වෙයි. 17 සියවස කාලයේදී ආදිවාසී ජනතාව අශීලාචාර (uncivilized) ජන කොටස් ලෙස ම හඳුන්වනු ලැබූ හ. තොමස් හොබ්ස් (Thomas Hobes) මේ ජනතාව වනචාරීන් (savages) ලෙස හැඳින්වූ අතර, ජීන් ජැක් රූසෝ (Jin Jack Rousseau) වැනි දර්ශනිකයන් විසින් ආදිවාසිහු වංශවත් වනචාරීන් (noble savages) ලෙස හඳුන්වන ලද හ. යුරෝපයෙන් මුල් කාලයේ බිහි වූ මානව විද්‍යාඥයින් විසින් ඉහත යෙදුම් පොදුවේ සියලුම ගෝත්‍ර සඳහා යොදගත් අතර, එය සාවද්‍ය බව පසු කාලීන මානව විද්‍යාඥයින් විසින් පෙන්වා දෙන ලදී (Purcell, 1998).

පළමුවන ලෝක යුද්ධයට පසුව  යුරෝපිය ජාතිකයෝ ශිෂ්ටාචාරවල වටිනාකම පිළිබද ව  සැක පහළ කිරිමට  පටන් ගත් හ. එයට හේතුව කෲර යුද්ධ පැන නැගුනේ ඉතා ඉහළ  යැයි සම්මත ශිෂ්ටාචාවලින්  වීම ය. ඒ අනුව, බොහෝ දෙනා යටත් විජිත විරෝධි ව්‍යාපාරයන්ට සම්බන්ධ වූ අතර ආදිවාසීන්  සම්බන්ධයෙන් වූ අශිෂ්ට හා වනචාරි යන යෙදුම් යටත් විජිතවාදයේ නිෂ්පාදන බව තෙරුම් ගත් හ. එසේ ම, යටත් විජිතවාදය වනචාරි ලෙස විනාශකාරි දෙයක් බවට ද මත පළ වන්නට විය. 20 වන සියවස මැද භාගයේ දී ආදිවාසීී හා පොදු ජනතාවට තමන්ගේ පාරම්පරික උරුමය වූ භූමිය හා තමන් ජිවත් කරවන ඉපැරණි  සංස්කෘතිය පිළිබඳ තීරණ ගැනීමේ අයිතිය තිබිය යුතු යැයි යුරෝපය පුරා ආකල්පමය වෙනසක් ඇති වූ බව බොහෝ විචාරකයින්ගේ මතයයි (Purcell, 1998).

### ආදිවාසීන්ගේ අනන්‍යතාව හා ආරක්ෂාව පතා ඔවුන් කළ ජාත්‍යන්තර සටන් ඉතිහාසය තුළ ආදිවාසිත්වය තේරුම්ගැනීම

කයුගා ඩෙස්කහෙහාස් (Kayuga Deskahehas) ජාතීන්ගේ සංගමය වෙත දැඩි බලපෑමක් එල්ල කළ ආදිවාසී නායකයෙකි. 1923 දී වසරක් පමණ ජිනීවා හි ගත කරමින් ජාතීන්ගේ සංවිධානය තුළ ආදිවාසීන් සඳහා පිළිගැනීමක් ඇති කිරීමට මොහු යත්න දැරී ය. ජාතීන්ගේ සංගමය තුළ සැලකිය යුතු අවධි කිරීමක් කිරීමට කයුන්ගාට නොහැකි වුවත් ස්විට්සර්ලන්ත ජනතාව සමඟ එක් ව, 1925 දී ඔහු මිය යන තෙක් ම ආදිවාසී අනන්‍යතාව වෙනුවෙන් සටන් කළේ ය (Carmer.1995:169-170).

1924 දී මඕරි ආගමික නායකයකු වන ටී.ඩබ්ලිව්. රත්නා (T.W. Rathna) විශාල ආදිවාසී කණ්ඩායමක් සමග එංගලන්තයේ ලන්ඩන් නගරයට පැමිණි අතර, 1840 නවසීලන්තයේ වේටැංගිහිදී ඇති කර ගත් ගිවිසුම උල්ලංඝනය කිරීම පිළිබඳ ජෝර්ජ් මහරජතුමාට පෙත්සමක් ඉදිරිපත් කිරීම මෙහිදී සිදු විය. ඉහත ගිවිසුමෙන් මඕරි ආදිවාසීන්ට භූමියට තිබූ අයිතිය තහවුරු කෙරුණු අතර, එය උල්ලංඝණය කිරීම පිළිබඳ මඕරි ආදිවාසිහු නොසතුටට පත් ව සිටියහ. රත්නා විසින් තම නියෝජිත පිරිසෙන් කොටසක් ජිනීවා නගරයට යවා ජාතීන්ගේ සංවිධානය ද දැනුවත් කිරීමට පියවර ගත්තේ ය. එංගලන්ත මහරජු මෙන් ම  ජිනීවාහි ජාතීන්ගේ සංගමය ද මොවුන් ගේ ඉල්ලීම්වලට කන් නොදුන් අතර, 1925 දී රත්නා ජිනීවාවලට පැමිණ ජාතීන්ගේ සංගමයට බලපෑම් කළ ද සතුටුදයක පිළිතුරක් නොලැබුණි (www.TeAra.govt.nz/en/biographies , 25.06.2016). අධෛර්යට පත් නොවූ ලෝක ආදිවාසී ජනතාව අන්තර්ජාතික කම්කරු සංවිධානය හරහා තම බලපෑම් දියත් කළ අතර, එහි  ප්‍රතිඵලයක් ලෙස 1957 දී ආදිවාසි ජනතාව හා ඔවුන්ගේ අයිතීන් සම්බන්ධ ව ප්‍රථම නෛතික ලියවිල්ල සම්මත කෙරිණි. එම ලියවිල්ල තවදුරටත් සංවර්ධනය කෙරුණු අතර එය ආදිවාසී හා ගෝත්‍ර ජනතාවගේ ප්‍රඥප්තිය (අංක 169) ලෙස 1989 දී සම්මත විය (Convention No. 169 n.d.10.06.2016).

1970 - 71 වන විට ලෝක ආදිවාසී ජනතාවට එල්ලවී තිබූ තර්ජන හා මානව හිමිකම් උල්ලංඝණය කිරීම් සැලකිල්ලට ගත් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සුළු ජාතීන් කොන් කිරීම පිටුදැකීම හා ඔවුන්ගේ ආරක්ෂාව සඳහා වූ අනු කමිටුව ඔස්සේ ආදිවාසී ජනතාව ගැන සවිස්තර අධ්‍යයනයක් දියත් කෙරිණි. 1971 දී ඒ සඳහා විශේෂ නියෝජිතයකු ලෙස ජෝසේ මාර්ටින්ස් කෝබේ (Jose Martinez Cobe) පත් කෙරිණි (https://www.culturalsurvival.org, 30.06.2016).

ආදිවාසී ජනතාව සම්බන්ධ එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිත මාර්ටින් කෝබේ විසින් අනු කමිටුවට සැපයූ ප්‍රගති වාර්තා නිසා, 1977 පමණ වන විට ආදිවාසී ජනතාව ලෝක ප්‍රජාවගේ අවධානය ඇද ගැනීමට සමත් වූහ. එසේ ම, ආදිවාසී ජනතාවගේ අයිතින් උල්ලංඝණය කිරීම සම්බන්ධ ව රාජ්‍ය නොවන සංවිධාන විසින් සංවිධානය කරන ලද

This work is licensed under a Creative Commons Attribution-NonCommercial-NoDerivatives 4.0 International License..

සමුළුවට සහභාගීවීමට ලෝක ආදිවාසී නියෝජිතයින් 200 ක් පමණ දෙනා ජිනීවා නගරයට එක් වූහ. මින් බොහෝ දෙනා අන්තර් ජාතික නීතිරීතිවලට ගැලපෙන ජන කණ්ඩායම්වලට සම්බන්ධ නොවූ අය නිසා ජිනීවා නගරයට ඇතුළුවීමට ඒ අයට ඉඩ නොලැබුණි. මෙම අනගි අවස්ථාව ප්‍රයෝජනයට ගත් එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් මෙම පිරිස සඳහා නවාතැන් පහසුකම් සපයා දෙන ලද අතර වර්තමානයේ ද මෙම කටයුත්ත ඒ ලෙස ම සිදුවෙයි (Venne, 2011: 559-560).

1981-1984 දක්වා කාලය තුළදී වෙළුම් පහකින් සමන්විත ලෙස සැකසුණු මාර්ටින්ස් කෝබේ අධ්‍යයන වාර්තාව ආදිවාසීන්ගේ අනන්‍යතාව තහවුරු කිරීමේ අරගලයේ සංධිස්ථායක් ලෙස සටහන් වෙයි. එම වාර්තාව මඟින් ආදිවාසී ජනතාව සම්බන්ධයෙන් ලෝක ප්‍රජාව තීරණාත්මක ලෙස මැදිහත් විය යුතු බවට අභියාචනා කෙරිණි. ඒ අනුව 1982 දී එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් පිළිබඳ අනු කොමිසම මගින් ආදිවාසී ජනතාව සම්බන්ධ ක්‍රියාකාරී කමිටුව (WGIP) ස්ථාපිත කෙරුණු අතර ආදිවාසී ජනතාවගේ මානව හිමිකම් සුරැකීම, මූලික නිදහස සුරැකීම මෙන් ම මෙම හිමිකම් සම්බන්ධ පරිනාමික ප්‍රමිතීන්ට ගරු කිරීම ආදිය ඇතුළත් වන සේ මෙම අයිතීන් ආරක්ෂා කිරීමට ප්‍රවර්ධනය කිරීමට සම්බන්ධ ප්‍රගතිය සමාලෝචනය කිරීමේ බලය ද ඉහත ක්‍රියාකාරී කමිටුවට පැවරුණි (http://www.ohchr.org, 25.06.2016).

1993 වසර අන්තර්ජාතික ආදිවාසී වසර ලෙස එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ප්‍රකාශයට පත් කෙරුණු අතර, සෞඛ්‍ය, අධ්‍යාපනය, සංවර්ධනය, පරිසරය හා මානව අයිතිවාසිකම් ආදී ක්ෂේත්‍ර තුළ ආදිවාසී ප්‍රජාව මුහුණ දෙන ගැටලුවලට විසඳුම් සෙවීම සඳහා අන්තර්ජාතික සහයෝගීතාව ශක්තිමත් කිරීම මෙම කටයුත්තේ අරමුණ විය. එසේ ම, මෙම වසරේදී මානව අයිතිවාසිකම් පිළිබඳ ලෝක සමුළුව අතරවාරයේ දී එක්සත් ජාතීන්ගේ සංවිධානය තුළ ආදිවාසීන් සඳහා ස්ථාවර අංශයක් ඇති කිරීම පිළිබඳ ප්‍රථම ඉල්ලීම ඉදිරිපත් විය.

1994 දී එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් අන්තර්ජාතික ආදිවාසී දශකය (1995-2004) ප්‍රකාශයට පත් කෙරිණි. මෙම දශක වැඩ සටහනේ දී එක්සත් ජාතීන්ගේ සංවිධානය තුළ ආදිවාසී ස්ථාවර ඒකකයක් පිහිටුවීම ප්‍රධාන කාර්යයක් ලෙස පිළිගත් අතර, එය ප්‍රධාන ඉලක්කයක් ලෙස ද ප්‍රකාශ කරන ලදී. එක්සත් ජාතීන්ගේ සංවිධානය හා එක්සත් ජාතීන්ගේ සංවිධානය තුළ වසර අසූවක පමණ කාලයක් තිස්සේ කළ අඛණ්ඩ හඬ නැඟීමක ප්‍රතිඵලයක් ලෙස ආදිවාසී හඬ ඉස්මතුවන්නට වූ බව පෙරේරා (Perera,2010 : 23) පෙන්වා දෙයි.

1995 දී ආදිවාසීන් සම්බන්ධ අන්තර්ජාතික ප්‍රඥප්තියක් කෙටුම්පතක සැකසීම සඳහා අන්තර්ජාතික මානව හිමිකම් කවුන්සිලය මඟින් ක්‍රියාකාරී කමිටුවක් පත් කෙරිණි.

2001 වසරේ දී මානව හිමිකම් කොමිසම මඟින් ආදිවාසීන්ගේ මානව හිමිකම් හා මූලික නිදහස සම්බන්ධ විශේෂ නියෝජිතයකුගේ භූමිකාව පිළිගත් අතර, එම නියෝජිතයාට පැවරුණු කාර්යය වූයේ ලෝක ආදිවාසී ජනතාවට සිදුවන මානව හිමිකම් උල්ලංඝණය වාර්තා කිරීම හා ඒවා පිටු දැකීම ට අවශ්‍ය ප්‍රතිකර්ම නිර්දේශ කිරීම ය. 2002 වසරේ දී එක්සත් ජාතීන්ගේ සංවිධානය තුළ ආදිවාසී ජනතාවගේ ඒකකය පිළිගැණුනු අතර එමගින් ආදිවාසීන්ට සෘජුව ම තම ගැටලු පිළිබඳ එක්සත් ජාතීන්ගේ සංවිධානය දැනුවත් කිරීමේ අවස්ථාව එළැඹිණි (https://www.un.org, 29.02.2016).

2004 දෙසැම්බර් 22 දින එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් දෙවන ලෝක ආදිවාසි දශකය (2004-2015) ප්‍රකාශයට පත් කෙරුණු අතර එහි තේමාව වූයේ “ගෞරවය හා ක්‍රියාකාරීත්වය සඳහා පංගුකාරත්වය” (Partnership for action and dignity) යන්න යි. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආර්ථික හා සමාජ කටයුතු පිළිබඳ නියෝජ්‍ය මහ ලේකම්වරයා යටතේ ක්‍රියාත්මක වන ලෙස නොසලකා හැරීම්වලින් තොර ව හා ආදිවාසීන්ට බලපාන තීරණය ගැනීමේ ක්‍රියාවලිය තුළ ඔවුන්ගේ සඵලදායී සහභාගිත්වය තහවුරු කිරීම සඳහා වූ වැඩසටහන් රාශියක් සැලසුම් කෙරිණි. දෙවන දශකයේ අරමුණ ඵලගැන්වීම සඳහා ස්වේච්ඡා අරමුදලක් ද පිහිටුවා ඇත. මෙම අරමුදල ආදිවාසී ජන කණ්ඩායම්වලට හා ඔවුන් වෙනුවෙන් කටයුතු කරන සංවිධානවලට මෙම දශකයේ විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආධාර සපය යි (http://www.iwgia.org, 25.06.2016).

වසර දෙකක පමණ සාකච්ඡාවලින් පසුව ආදිවාසීන් ගේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය මානව හිමිකම් කවුන්සිලය මඟින් අනුමත කෙරිණි. එය එක්සත් ජාතීන්ගේ මහා සංගමයේ 61 සැසියට ඉදිරිපත් කිරීමට නියමිත විය. මෙම ප්‍රඥප්තිය මඟින් ආදිවාසීන්ගේ පෞද්ගලික හා සාමූහික අයිතීන් සංස්කෘතික හා අනන්‍යතා අයිතීන් ද ඊට අමතර ව අධ්‍යාපනය, සෞඛ්‍ය, රැකිරක්ෂා, භාෂාව හා වෙනත් අංශ පිළිබඳ අයිතීන් ද සුරැකීම තහවුරු කෙරෙයි. ඔවුන්ට විඳීමට සිදුවී ඇති කොන්කිරීම් ඇතුළු මානව හිමිකම් උල්ලංඝණයන් මෙමඟින් පිටුදකින අතර, තමන්ට බලපාන කරුණු පිළිබඳ තීරණ ගැනීමට ඔවුන්ගේ පූර්ණ සහභාගිත්වය මෙමඟින් තහවුරු කොට ඇත. එසේ ම, තම ජන කොටසේ සුවිශේෂීතාව රැක ගෙන ආර්ථික සමාජ හා සංස්කෘතික සංවර්ධනය පිළිබඳ තමන්ගේ දැක්ම තහවුරු කොට කටයුතු කිරීමේ අයිතිය ද මෙම ප්‍රඥප්තිය මඟින් ආදිවාසීන්ට ලැබී ඇත (http://www.un.org/esa/socdev/unpfii/ 23.06.. 2016).

2007 සැප්තැම්බර් 13 බ්‍රහස්පතින්ද දින මෙම ප්‍රඥප්තිය එක්සත් ජාතීන්ගේ සංවිධානයේ 61 වන සැසිවාරයේ දී සම්මත වූ අතර, එය අන්තර්ජාතික මානව හිමිකම් නීති ක්ෂේත්‍රයේ ඉතාමත් සුවිශේෂී ප්‍රඥප්තියක් ලෙස ඉතිහාස ගත වී ඇත. මෙම ප්‍රඥප්තියට රටවල් හතරක් විරුද්ධ විය. ඒවා නම්, ඔස්ට්‍රේලියාව, කැනඩාව, නවසීලන්තය, සහ ඇමරිකා එක්සත් ජනපදය යි. රටවල් දෙළහක් ඡන්දය දීමෙන් වැලකී සිටිය හ. රටවල් 143 ක් පක්ෂ ව ඡන්දය පාවිච්චි කළ හ. මෙම ප්‍රඥප්තිය මෙසේ සම්මතවීම නිසා ආදිවාසි ජනතාවගේ අයිතීන් වෙනුවෙන් ලෝක ප්‍රජාව කටයුතු කරන බව තහවුරු විය (Perera, 2010 : 76).

### ආදිවාසී අභිලාස ඔස්සේ ආදිවාසිත්වය තෙරුම් ගැනීම

ආදිවාසී ප්‍රජාවගේ අභිලාස පිළිබඳ ව බොහෝ අන්තර් ජාතික රැස්වීම් හා සමුළුවල දී කරුණු ඉදිරිපත් වී ඇත. එවා ඔස්සේ යමින් ආදිවාසිත්වය යම් දුරකට හඳුනා ගත හැකිවෙයි. ඒම අභිලාස ප්‍රධාන කොටස් හතරක් ඔස්සේ සාකච්ඡා කළ හැකි ය.

This work is licensed under a Creative Commons Attribution-NonCommercial-NoDerivatives 4.0 International License..

1. ආදිවාසී අයිතීන් හඳුනා ගැනීම හා ඒවාට ගරු කිරීම.
2. ආදිවාසී සංස්කෘතින්ට හා ඔවුන්ගේ දැනුම් පද්ධතියට ගරු කිරීම.
3. අර්ථවත් සහභාගිත්වයකට ඇති අයිතිය තහවුරු කිරීම.
4. ක්‍රියාකාරිත්වයට ඇති ස්වතන්ත්‍ර අයිතිය.

තමන්ගේ භූමි අයිතියට පමණක් නොව තමන්ගේ සියලුම අයිතීන්ට අන් ජන කොටස් ගරු කළ යුතු බව ආදිවාසීහු අපේක්‍ෂා කරති. තමන්ට පරම්පරාවෙන් හිමි වී ඇති භූමිය සඳහා නෛතික පිළිගැනීමක් තිබිය යුතු බව ඔවුහු අපේක්ෂා කරති. එසේ ම, තමන් ජීවත් වන ප්‍රදේශවල ඇති ස්වාභාවික සම්පත්වලට ද ඔවුන් සිය අයිතිය තහවුරු විය යුතු බව ඔවුන්ගේ බලාපොරොත්තුවයි. ආදිවාසී ජනතාවගේ මතයට අනුව, භූමිය යනු තම ජීවිකාව පවත්වා ගෙනයාම සඳහා වූ වත්කමක් පමණක් නොව, ආදිවාසීන් ලෙස ඔවුන්ගේ පැවැත්ම තහවුරු කරනු ලබන මූලික පසුබිම ලෙස ද ඔවුන් විසින් භූමිය සලකනු ලබයි.

ආදිවාසීහු තම විවිධත්‍වය භාෂාවන් හා ඔවුන්ගේ විශ්වාස හා දැනුම් පද්ධති ගැන සාඩම්බරකමකින් යුක්ත වූවෝ වෙති. ඔවුන්ගේ විශ්වාස හා ඇදහිලි මෙන් ම, ඒ හා බැඳුණු වත් පිළිවෙත්වල වටිනාකම් ආදිවාසී නොවන ජන කොටස් හඳුනා ගනිමින් සිටිති. කලක් තිස්සේ ක්‍රියාත්මක වන සංවර්ධන වුවමනාවන් නිසා වියැකී යමින් තිබෙන හා තර්ජනයට භාජනය වී තිබෙන තම වටිනාකම් පද්ධතිය හා ජීවන රටාවට ගරු කරන ලෙස ආදිවාසීන් අන් ජන කොටස්වලින් ඉල්ලා සිටින බවත් තමන්ට හිමි භූමියෙහි කරන කියන දේ ගැන ඔවුන්ගේ අනුමැතිය ලබා ගැනීම ඔවුන් අපේක්‍ෂා කරන අතර, මිල කළ නොහැකි ඔවුන්ගේ දැනුම් පද්ධති ප්‍රයෝජනයට ගන්නා පිරිස් විසින් ඊට සාධාරණයක් ඉටු කළ යුතු බවත් ඔවුහු අපේක්‍ෂා කරති (http://www.globalissues.org 25.06.2016).

පෙරේරා (Perera, 2010:16-17) දක්වන ආකාරයට තමන් ජීවත්වන රටවල සංවර්ධනය සම්බන්‍ධයෙන් දයකත්‍වයක් දැරීම හා ප්‍රතිලාභ ලැබීම යන අංශ දෙකෙහි ම සහභාගිත්ව අයිතිය තමන්ට තහවුරු විය යුතු බව ආදිවාසිහු අපේක්‍ෂා කරති. මෙම සහභාගිත්‍වය වඩාත් අර්ථවත්වීම සඳහා නිවැරදි තොරතුරු දැනගැනීමේ හා තීරණ ගැනීමේ ක්‍රියාවලියට සම්බන්‍ධවීමේ අයිතිය ද ඔවුහු බලාපොරොත්තු වෙති. තමන්ට බලපාන අන්තර්ජාතික ප්‍රශ්න වන, මිහිතලය උනුසුම්වීම, බුද්ධිමය දේපල අයිතිය හා මානව හිමිකම් යන ක්‍ෂේත්‍රවලට සම්බන්‍ධ අන්තර්ජාතික ගිවිසුම් ආදිය සාකච්ඡා කෙරෙන අවස්ථාවලදී තමන් පිළිගන්නා ලෙසට හා තම සහභාගිත්‍ව අයිතිය තහවුරු කරන ලෙස ඔවුහු ඉල්ලා සිටිති. ජාතික රාජ්‍යයන්වල කොටස් ලෙස හෝ රාජ්‍ය නොවන සංවිධාන ව්‍යුහයන් හරහා හෝ, තම අයිතිවාසිකම් හා දෘෂ්ටින් සඳහා වූ අවස්ථාව තහවුරු කරනලෙස ඔවුහු ඉල්ලා සිටිති. තම අයිතීන් හඳුන්වාදීම සඳහා වූ අරගලයට ඔවුන්ගේ ඇති සහභාගිත්වය ද පිළිගන්නා ලෙස ආදිවාසීහු ලෝක ප්‍රජාවට බල කරති. අද ලොව මුහුණ දෙන සමාජ හා පාරිසරික අභියෝගවලට විසඳුම් සෙවීමේදී තමන්ට ද ඒ සඳහා දයකත්වයක් දැරිය හැකි බව ප්‍රකාශ කරන ආදිවාසීහු ඒ සඳහා ද සිය සහභාගිත්වය පිළිගන්නා ලෙස ඉල්ලා සිටිති.

ලෝක ආදිවාසීන්ගේ මීළඟ අභිලාෂය වන්නේ ක්‍රියාකාරිත්වය සඳහා වු ස්වතන්ත්‍ර අයිතිය යි. තම භූමිය හා සම්බන්ධ තීරණ ද ඇතුළු ව තම කටයුතු සම්බන්ධයෙන් තීරණ ගැනීමේ ස්වතන්ත්‍ර අයිතිය ලැබීම ආදිවාසීන්ගේ අභිලාසයකි. ඔවුන්ගේ ජාතික රාමුවක් තුළ ඔවුන්ගේ මාර්ග ඔස්සේ සංවර්ධන ඉලක්ක තෝරාගැනීමට ඉඩකඩ ලැබේයැයි ආදිවාසීහු කල්පනා කරති. එම අයිතිය පිළිගන්නා ලෙස අනෙකුත් ජනකොටස්වලින් ඔවුහු ඉල්ලා සිටිති. ඔවුන්ගේ ම ප්‍රාදේශීය ආයතන ඔස්සේ කටයුතු කිරීමේ අවස්ථාව ද ඔවුන්ගේ ම නායකත්වය හා සංවර්ධන ව්‍යූහයක් ගොඩනගාගැනීමේ අවස්ථාවද ඔවුන් කෙරෙහි පමණක් බලපාන කරුණුවලදී තම පාරම්පරික නීතිය බලපැවැත්වීමේ අයිතිය ද ඔවුහු ඉල්ලා සිටිති. ජාතික මට්ටමේ කටයුතු පිළිබඳව ද අවධානය යොමු කරන ආදිවාසීන් කියා සිටින්නේ ජාතික ප්‍රතිපත්ති සැලසුම් හා සංවාදවලදී තමන් ද සහභාගි කරගන්නේනම් දිළිඳුකම පිටුදැකීම ආදි කරුණු හා වෙනත් බොහෝ දේ සම්බන්ධයෙන් ජාතික සංවර්ධනයට දයකත්වයක් තමන්ට ද දැරිය හැකි බව ය (https://www.ifad.org, 21.06.2016).

### ආදිවාසී ජනතාව හා භූමියේ ඒකාබද්ධතාව අතුරින් “ආදිවාසිත්වය” හඳුනා ගැනීම

කෙනෙකුට භූමිය අයත් නොවූ බවත් කෙනෙකු භූමියට අයත් වූ බවත් (One did not own land. One belonged to the land) මීඩ් ප්‍රකාශ කරයි (Mead,2003:271). පැරණි දැනුම් සම්ප්‍රදායයන් ඇසුරු කොට බලන විට ද පැහැදිලි වන්නේ මෙම ජනතා - භූමි ඒකාබද්ධතා සංකල්පය දිව්‍යමය කාරණාවක් වන බව යි. ජුදා ක්‍රිස්තියානි සම්ප්‍රදාය අනුව බලන කල වුව ද පෙනී යන කරුණක් වන්නේ, ඊශ්‍රායලය හා පලස්තීනය අතර ගැටුමත්, ඊජිප්තුවේ සිට තෝරා ගත් සෙනඟ ඊශ්‍රායලය කරා පැමිණීමත් යන කාරණා සැලකිල්ලට ගැනීමේ දී මීට පදනම් වී ඇත්තේ ද ශුද්ධවූ දේශය හෙවත් ශුද්ධ භූමිය (holy land) පිළිබඳ පිලිගැනීම බව ය. ආදිවාසී ජනතාව භූමිය හා ඇති සබැඳියාව මෙන් ම, ළබැඳියාව ගැන කථා කිරීමේ දී යටත්විජිතවාදී අත්දැකීමෙන් ඔබ්බට ගොස්, මේ ගැන සලකා බැලිය යුතු වෙයි. එයට හේතුව, යටත්විජිතවාදීන්ට භූමිය හා ඇති සබැඳියාවක් හෝ ළබැඳියාවක් නැතිවීම යි. ආදිවාසී දෘෂ්ටියෙන් බලන විට පෙනී යන්නේ ආදිවාසී පුද්ගලයා හා ආදිවාසී ප්‍රජාවේ පැවැත්ම හා වෙනස්කම් ඇති කිරීමට මෙම දිව්‍යමය භූමි සංකල්පය බලපාන ලද බව ය.

නවසීලන්තයේ ඔටියරෝවා (Aotearoa) ප්‍රදේශයේ මඕරි ජනතාව අතර ප්‍රචලිත ජන භූමි ඒකාබද්ධතාව පිළිබඳ අදහස් විමසීමෙන් ඔවුන්ගේ දිව්‍යමය භූමි සංකල්පය තේරුම් ගත හැකි වෙයි. භූමිය සඳහා අයිතිය කීමේ දී මෙම ප්‍රදේශයේ ජනතාව එම භූමි ප්‍රදේශය හැඳින්වූයේ තම ශරීරයේ කොටසක් ලෙස ය. එහිදී ආදිවාසී සාමාජිකයකු වන ටමටෙකපුවා (Tamatekapua) මකෙටු අර්ධද්වීපය (Maketū Peninsula) හඳුන්වා දුන්නේ මෙසේ ය.

> “අර එහා පෙනන භූමිය මගෙන් පැවතෙන අය සඳහා ඉල්ලනවා. එය මාගේ හුස්ම පොද ලෙස නම් කරනවා”. (The land that we see ahead I shall claim for my descendants. I shall name it the bridge of my nose) එම අවස්ථාවේදී ඔහු මෙසේ ද සඳහන් කරන ලදී.
>
> (That small hill away to the south, and the land between it and the mountain yonder shall be called the belly of tapuika) දකුණට වෙන්න තියෙන්නේ අර

This work is licensed under a Creative Commons Attribution-NonCommercial-NoDerivatives 4.0 International License..

> පුංචි කඳු ගැටයක්. එයට එහා පෙනෙන කන්දට මැදිව ඇති භූමිය නම් කරන්නේ ටපුයිකාගේ උදරය ලෙස යි (Royal 2002 : 2).

එසේම මඕරි ජාතික විද්වතෙකු වන සී. රෝයල් තවදුරටත් පවසන්නේ, තම ගෝත්‍ර ජනතාව ජීවත් වන ප්‍රදේශයේ ටරරුවා (Tararua) කඳු වැටිය මුතුන් මිත්තන් විසින් නම් කොට ඇත්තේ *Te Tuarātapu-o-Te Rangihaeata* හෙවත් රංගිහයේටාගේ ශුද්ධ වූ පසු ප්‍රදේශය (The secred back of te rangiheata) යනුවෙන් බව යි. භූමිය හා ආදිවාසීන් අතර සබැඳියාව හා ළබැඳියාව තවදුරටත් හඳුනා ගැනීමේදී 19 ශත වර්ෂයේ දී ජීවත් වූ නවසීලන්තයේ නගාටි ටව්හරේටෝවා (Ngāti Tūwharetoa) ගෝත්‍ර නායකයකු වන ටෙ හියුහියු මනානුයි (Te Heuheu Mananui) 1840 දී වේටැංගි (waitangi) ගිවිසුමට අත්සන් කිරීම ප්‍රතික්ෂේප කරමින් කළ ප්‍රකාශය වැදගත් වෙයි.

> "එවිට ඔහුගේ ශරීරය ඇද වැටෙනු ඇත. ඔහුගේ එක කලවයක් ටිටි - ඔ - කුරා (Titī-o-kura) මත වැතිර බැබලෙයි. අනෙක ඔටායිරි මත (Ōtāiri) මත වැතිර ඇත. ඔහුගේ එක් උරහිසක් පැරිටෙටායිටෝන්ගා (Paretetaitonga) මත ද, අනෙක ටුහුවා (Tūhua) මත ද විය. ඔහුගේ හිස (Tongariro) ටොන්ගාරිරෝ මත ද ශරීරය (Taupō) ටාවුපෝ මත ද වැතිර තිබිණි. මෙසේ සිදුවී ඇත්තේ මෙම භූමිය ශුද්ධ කිරීමට හා මෙම යාය තුළ ඔහුගේ අධ්‍යාත්මික බලඅධිකාරිය පැවැත්වීම සඳහා ය" (Royal, 2002:2).

ටිටි - ඔ - කුරා , ඔටායිරි, පැරිටෙටායිටෝන්ගා , ටුහුවා සහ ටොන්ගාරිරෝ කඳු මුදුන් වන අතර, ටාවුපෝ යනු නවසීලන්තයේ උතුරු දූපතේ ප්‍රධාන ම අභ්‍යන්තර ජලාශය (විල) ද වෙයි. මඕරි ලෝකය පුරා මෙවැනි බොහෝ සම්ප්‍රදයන් පවතියි. 1935 දී මඕරි ගෝත්‍ර ප්‍රධානින් නිදහසේ ප්‍රකාශනය අත්සන් කරන විට ඔවුන් ජාතිය ලෙස හඳුන්වා තිබුනේ (Te Whenua) rangatra (the chiefly land) හෙවත් ප්‍රමුඛ භූමිය යනුවෙනි. මෙහි අදහස වන්නේ සියල්ලට මත්තෙන් භූමිය බව යි. මෙහිදී සමස්ත රට ම එකම භූමි වස්තුවක් ලෙස දක්වා ඇත. ඒ අනුව, 1835 දී මඕරි නායකයන් විසින් ජාතිකත්වය පිළිබඳ මතය ලෙසත් ඉහතින් දැක් වූ, සියල්ලට මත්තෙන් භූමිය යන්නත් මෙම මතය ග්‍රහණය කොට සිටීම සඳහා වූ ඔවුන්ගේ සම්මානනීය සැලකිල්ලත් අවධාරණය කෙරිණි. සමස්තයක් ලෙසින් ගතවිට මෙම සම්ප්‍රදය අනුව, භූමිය පුද්ගලයන් සංකේතවත් කරන්නේ නැත. එහි මීට වඩා ගැඹුරු අදහසක් පවතියි. එනම් භූමිය යනු පුද්ගලයා ම යි. පුද්ගලයා යනු භූමිය ම වෙයි (Land is the person, the person is the land).

මෙහිදී රෝයල් (Royal, 2002:27) සඳහන් කරන්නේ නවසීලන්තයේ (Ngāti Ruwanka) නගාටි රුවන්කා ප්‍රදේශයේ පැරැන්නෙකු වන ටේ විටු (Te-Whetu) හා එඩ්වර්ඩ් ටේ‍රන්ජර් අතර ඇතිවූ සංවාදයක් ඇසුරින් ඉහත කාරණය තවදුරටත් තහවුරු කර ගත හැකි බව ය. ඒ අනුව, ටෙවිටු විසින් එඩ්වර්ඩ් ටේ‍රන්ජර් ට විශාල ගලක් නැරඹීමට ආරාධනා කෙරිණි. ටේ විටු ප්‍රකාශ කළේ එම ගල ඔහුගේ පරම්පරාවේ පැරැන්නෙකු බව යි. එය පැරැන්නෙකුට සංකේතවත් කරමින් කථා කරනවාදැයි එඩ්වර්ඩ් ඇසුවේ ය. ටෙ විටු කියා සිටියේ එසේ නොවන බවත් මෙම ගල තම පැරණි ප්‍රබල ඥාතියකු බවයි. මෙම ගල් පර්වතය තුළ පුද්ගලභාවයක් සහිත පෞරුෂයක් ඇති බව මෙම මවෝරි නායකයා අවධාරණය කරයි.

භූමිය හා ආදිවාසී මානව පුද්ගලයා අතර පවතින මෙම එකාබද්ධතාව විසින් ස්වාභාවික ලෝකය හා මානව ස්වභාවය අතර ඇති ඥාතිත්වය ගැන ගැඹුරු අවබෝධයක් ලබා දෙයි. රතු ඉන්දියානු ආදිවාසී නායක සියැටල් විසින් 1854 දී ඇමරිකානු ආණ්ඩුකාර අයිසැක් ඉන්ගාල්ස් ස්ටීවන්ස්ට කළ කථාවෙන් තහවුරු වන්නේ ඉහතින් සඳහන් කළ ආකාරයට භූමිය හා ආදිවාසී ජනයා අතර පවතින සහසබඳතාවයි. සියැටල් විසින් මෙම කථාව කරන ලද්දේ රතු ඉන්දියානු ආදිවාසීන් සතු ඉඩම් ඇමරිකානු රජයට විකුණන ලෙස ආණ්ඩුකාරවරයා කළ ඉල්ලීමට පිළිතුරු වශයෙනි. මෙම ලිපියේ කොටසක් මෙසේ දැක්වෙයි.

"ඉදින් අපගේ ඉඩම් මිලදී ගැනීමට කරපු යෝජනාව අපි සලකලා බලනවා. ඒ ඉල්ලීම පිළිගැනීමට අපි තීරණය කළොත් මම එක කොන්දේසියක් ඉදිරිපත් කරනවා. ඒ සුදු මිනිසා මේ භූමියේ සිටින සතා සීපාවා තමාගේ සහෝදරයා ලෙස සැලකිය යුතු වෙනවා. සත්තු නැති වෙච්චදාට පාලුව ඉවසාගන්න බැරිව මිනිස්සු මැරිලා යාවි. මේ හැම දෙයක් ම එකිනෙකට සම්බන්ධයි.... අපි එක දෙයක් දන්නවා පොළාව මිනිසාට අයිති නැත. මිනිසා පොළවට අයිති ය. අපි මේ දෙය දන්නවා. හැම දෙයක් ම එකිනෙකට සම්බන්ධයි. හරියට ගල් බැම්මෙන් බැඳුණු පවුරක් වගේ. ජීවිතය කියන දැල විව්වේ මිනිසා නොවෙයි. මිනිසා ඒ දැල් එක් නූල් පොටක් පමණයි. මිනිසා දැලට යමක් කරනවා නම්, ඒක තමන්ට කරන දෙයක්" (රාහුබද්ධ,2008:18).
එක් අවස්ථාවක දී මඕරි ආදිවාසීන්ගේ වනාන්තර චාරිත්‍ර ගැන මඕරි ආදිවාසියෙකුගෙන් විමසන විට මෙසේ පිළිතුරු ලැබෙයි.

> " කිසියම් ස්ථානයක් අපට ගැලපේ ද, මෙහි හොඳින් වාසය කළ හැකි ද යන්න තීරණය කෙරෙන ක්‍රම තියෙනවා. ආදිවාසී ජනතාව යම් ස්ථානයකට ගිය විට විශේෂයෙන් ම තමන් වාසය සඳහා තෝරා ගන්නා ස්ථානයට ගිය විට එසේ ම තම ප්‍රජාව ගොඩනැඟීම සඳහා ප්‍රදේශයක් තෝරා ගන්නා විට ඔවුන් එම ස්ථානයටත්, එහි ගහ කොළවලින් සතා සිව්පාවාගෙන් තමන් එම ස්ථානයට වාසය සඳහා පැමිණීම සුදුසුදැයි විමසනවා. එසේම එම දේවල් සමඟ අන්‍යෝන්‍ය සබඳතාවක් ගොඩනගා ගන්නවා. ඒ අනුව එසේ ඇතිකරගන්නා ගිවිසුම පරම්පරා ගණනාවක් පවත්වාගෙන යනවා. එය ඔවුන් ඉතා ගෞරවයෙන් කරනවා. මෙය දිගු කාලීන සබඳතාවක්" (Oberll,1991:1-2).

මෙම කරුණු සැලකිල්ලට ගැනීමේ දී'ආදිවාසි' යන්න ස්වභාවික ලෝකය හා ආදිවාසි මානව ප්‍රජාව අතර පවතින අන්‍යෝන්‍ය බැඳීම ලෙස ගැනීමෙන් ඔවුන්ගේ සංස්කෘතික අනන්‍යතාව මැනවින් තහවුරු වෙයි. ආදිවාසීන් සම්බන්ධ යටත් විජිත යෙදුම් වන ස්වදේශීය (native) ආදිවාසි (indigenous) ආදී පැහැදිලි කිරීම්වලට එහා ගිය භූමිය සමඟ සුවිශේෂී සබඳතාවක් පවත්වා ගෙන යන එසේ ම, පාරම්පරික දැනුම් සම්ප්‍රදයකට හිමිකම් කියන ජනතාවක් ලෙස ඔවුන් මතු කොට දැක්වීම උචිත බව ආදිවාසී විද්වතුන්ගේ අදහස යි. එසේ ම, විශේෂයෙන් පාරිසරික හා පරිසර විද්‍යාත්මක ලෙස භාවිත කෙරෙන පැරණි දැනුම් සම්ප්‍රදය ආදිවාසී උරුමය බව අවධාරණය කෙරෙයි. මෙය යම් ස්ථානයක් සම්බන්ධ ආදිවාසී පරිසර විද්‍යා දර්ශනය (indigenous eco-philosophy of a place) ලෙස

This work is licensed under a Creative Commons Attribution-NonCommercial-NoDerivatives 4.0 International License..

දැක්විය හැකි ය. මෙහිදී ඔස්ට්‍රේලියානු ආදිවාසීන්, සවදේශිය ඇමරිකානුවන් ආදී යටත් විජිතවාදයෙන් බැට කෑ ආදිවාසීන් අරබයා පමණක් යෙදෙන නිර්වචනයක් ගොඩ නො නැගිය යුතු ය. එනම්, සියලුම ලෝක ආදිවාසී ප්‍රජාවට උරුම නිර්වචනයක් තිබිය යුතු ය. අනාදිමත් කාලයක සිට භූමිය සමග සහ - සබඳතාවකින් (unification) යුතු ව සිටින ජන කොටස් ආදිවාසීන් ලෙස පිළිගැනීමෙන් ඔවුන්ට භූමියට ඇති උරුමය ද ඉන් තහවුරු වෙයි (Grace,1992:52).

## ආදිවාසී ඇදහිලි හා විශ්වාස ඔස්සේ ආදිවාසිත්වය හඳුනා ගැනිම

ලෝක ජනතාව දේවත්වය හා එය රැඳී ඇති ස්ථාන විශ්වාස කරන ආකාරය අනුව ද "ආදිවාසිත්වය" සුවිශේෂී ලෙස හඳුනාගත හැකි ය. ආදිවාසී ලෝක දෘෂ්ටීය, විශ්ව තලයක ලා ගත් විට අපට බෙහෙවින් අසන්නට ලැබෙන පෙරදිග හා අපරදිග ලෝක දෘෂ්ටීන්ගේ සුවිශේෂතාවට හා සන්දර්භයට සංසන්දනාත්මක ලෙස ගැනෙන නව හරස් සංස්කෘතික ලෝක දෘෂ්ටියක් ලෙස දැකිය හැකි වීම විශේෂත්වයකි. මෙම කරුණ පහත ආකාරයට පැහැදිලි කළ හැකි ය. එනම් ජුද ක්‍රිස්තියානි සම්ප්‍රදායට අනුව දෙවියෝ ලෝකයට පිටස්තර ව ස්වර්ගය නම් ස්ථානයක වාසය කරති. මෙම ලෝකය දෙවියන් විසින් මවා ඇති අතර එය ඔහුට සමාන නොවේ. එසේ ම එය දෙවියන් ද නොවේ. එය සෑහෙන දුරට දෙවියන්ගේ මැවුම්කාර බලයේ ලකුණකි. පෙරදිග දෘෂ්ටියට අනුව අනෙක් අතට බෙහෙවින් ම බරතැබීමක් කෙරෙනුයේ ඇතුළාන්ත මාර්ග කෙරෙහි ය. එනම් තමන් තුළින් ම දේවත්වය සොයාගැනී්මේ මාර්ගය කෙරෙහි ය. උදාහරණයක් ලෙස පෙරදිග භාවනානුයෝගී භාවිතයන් හා ආශ්‍රමික ජීවිතය පෙන්වා දිය හැකි ය. ආදිවාසී ලෝක දෘෂ්ටීන්ට අනුව ඔවුන්ට දෙවියන් මෙලොව ම දෘෂ්‍යමාන වෙයි. විශේෂයෙන් ම ආදිවාසීහු ඇළ, දෙළ සාගරය කාන්තාර හා වනාන්තර ආදී ස්ථානවල හා වස්තූන්හි දෙවියන් දකිති. මෙම දෘෂ්ටියට අනුව ස්වාභාවික සංසිද්ධී්න් අරබයා මානව අනන්‍යතාව පැහැදිලි කළ හැකි ය. එය මඹිරි ප්‍රකාශනයක් ලෙස ගතහොත් *(Such and such is the mountain, such and such is the river, such and such is the ancestor) අසවල් තැනැත්තා (අර) කන්ද යි. අසවල් තැනැත්තා (අර) ගංගාව යි. අසවල් දෙය (අපේ) මුතුන්මිත්තා වෙයි'* ආදී වශයෙනි. ඒ අනුව ලෝකය සමග ඒකීයත්වයක් නොහොත් ස්වීයත්වයක් (oneness) හා ඒකාබද්ධතාවක් පිළිබඳ හැඟීමක් සොයා යන ඉතා සුවිශේෂී හැසිරීම් රටාවක් සහ වටිනාකම් රටාවක් සඳහා පිටුබලයක් ආදිවාසී ලෝක දෘෂ්ටීන් විසින් සපයනු ලබයි (Royal, 2002 : 4)

## වැදි ජනතාවගේ ඇදහිලි හා විශ්වාස තුළ ආදිවාසිත්වය හඳුනා ගැනිම (ශ්‍රී ලාංකික දෘෂ්ටිය)

ශ්‍රී ලංකාවේ වැදි සමාජයට බාහිර ව තිබෙන අනෙක් සමාජ කොටස් අතර ප්‍රධාන ආගම් හතරක් ක්‍රියාත්මක වෙයි. එනම් බෞද්ධ, හින්දු, ක්‍රිස්තියානි හා ඉස්ලාම් වශයෙනි. මෙවන් පරිසරයක වැදි ජනතාව විසින් මෙම කිසිදු ආගමකට සම්බන්ධයක් නොමැති ව නෑ යකුන් ඇදහීම තම ආගම කරගෙන සිටිති. තමන්ගේ හා තම පරිසරයේ ආරක්ෂාව පතා ඔවුන් වඳින පුදන නෑ යකුන් තමන් අතරින් ම මියගිය අය වෙති. ඔවුන් මියයාමෙන් පසුව තමන්ගේ ආරක්ෂකයන් වී නැවත පැමිණෙන බව වැදි ජනතාව විශ්වාස කරති. මේ කරුණ අනුව, ශ්‍රී ලාංකික ආදිවාසින්ගේ හෙවත් වැදිජනතාවගේ වැදිකමේ සුවිශේෂීතාවක් දැකිය හැකි ය. ඔවුහු මෙලොව හා බැඳී සිටිති. මිය ගිය ද නැවත මෙලොව පරිසරයේ ම සැරි සරති. ගහ කොළ රකින තම වර්ග ජනයා කෙරෙහි ඇලුම් කරති. තමන් උපන් භූමිය පුරා අණසක පතුරුවති. එසේ ම තම භූමිය ආරක්ෂා කරති. මෙම නෑ යකුන් පිළිබඳ සංකල්පය ශ්‍රී ලංකාවේ ආදිවාසී හෙවත් වැදි ජනතාවගේ ජීවන රටාව කෙරෙහි බෙහෙවින් ම බලපා ඇත. මරණින් පසුව වුව ද වෙනත් ලොවක සැප නොපතා මෙලොව තම ඥාතීන් මෙන් ම තම ජීවිතය හා සමාන වූ ස්වාභාවික පරිසරයට අරක් ගෙන සිටීම ඔවුන්ගේ අභිලාසය යි (Seligmann, 1993) බස්නායක (2009:120) සඳහන් කරන්නේ මෙය ශ්‍රී ලංකා ආදිවාසි වැදි ජනතාවගේ අනන්‍යතාවේ සුවිශේෂී් ලක්ෂණයක් ලෙස දැක්විය හැකි බව ය. එසේ ම, මෙම ලේඛිකාවට අනුව, එය ඔවුන්ගේ ජීවන රටාවේ අනන්‍යතාව ද තහවුරු කරයි. මහා වනාන්තරයේ තනි ව ම යෑමට ආදිවාසීහු බිය නො වෙති. එයට හේතුව නෑ යකුන් තමන් සමඟ සිටින බවත් ඔවුන්ගේ ආරකෂාව තමන්ට ලැබෙන බවත් ඔවුන්ගේ විශ්වාසය වීම ය. එසේ ම, සතුන් දඩයම් කිරීමෙන් පසුව නෑ යකුන්ට ආහාර කොටසක් වෙන්කිරීමෙන් තමන් සුරකින පිරිස් සමඟ තමා සතු දේ බෙදා ගැනීමේ උසස් කටයුත්තක අරුතක් ද මෙමගින් කියාපායි. ඒ අනුව පැහැදිලි වන්නේ මිය යන ඥාතීන් නැවත දෙවියන් (නෑ යකුන්) ලෙස ජීවමාන ව සිටින බව ආදිවාසීන් කරයේ විශ්වාස කරන බව යි. ලෝකයේ සෑම ආදිවාසී සම්ප්‍රදායක් තුළ ම කඳුපෙත්, ඇළ දෙළ හා මියගිය ආදිවාසී ආත්ම (නෑ යකුන්) වන්දනීය ලෙස සැලකෙයි (සෝමසුන්දර, 2009:23).

ඉහත කරුණු විසින් තහවුරු කරනු ලබන්නේ "ආදිවාසී"යන්න පිළිබඳව ලෝක දෘෂ්ටිය, පරලොව නොව මේ ලෝකය සමඟ ඒකාබද්ධ වන ස්වභාවයක් පිළිබිඹු කරන්නා වූ හැඟීම් වර්ධනය කරන අද්විතීය වටිනාකම් හා හැසිරීම් පද්ධතියක් සඳහා පිටුබලය ලබා දෙන බව යි. කිසියම් ප්‍රජාවක අනන්‍යතාව තහවුරුවීම සඳහා ඔවුන් ජීවත්වන බූමිය නොහොත් පරිසරය බෙහෙවින් ම බලපායි. ශ්‍රී ලංකාවේ ආදිවාසින් සම්බන්ධයෙන් ද මෙකී නිර්ණායකය එසේ ම වෙයි.

## සමුද්දේශ

බස්නායක, රම්‍යා (2009)ආදිවාසි සමාජය, දන්කොටුව, වාසනා ප්‍රකාශකයෝ.

රාහුබද්ධ සුමිත්‍රා (2008) සියැටිල් මාමා (රතු නායක සියැටිල්ගේ අති රමණීය පරිසරය කථාව), නුගේගේඩ, Platform for Alternate culture'

සෝමසුන්දර, දයානන්ද (2009)අප්‍රිකාවේ ආදි වාසීන්, දයානන්ද සේමසුන්දර සහ 'හේරත් මාදන බණ්ඩාර සංස්, ලෝකයේ ආදිවාසීන්, කොළඹ, එස්. ගොඩගේ සහ සහොදරයෝ.

Carmer, C. (1995) My Kind of Country, New York, Syracuse University press.

Firth, R. (1959) Social change in Tikopia, London; Allen and Unwin.

Gluckman, Max., (1965) Politics, Law and Ritual in Tribal Society, Oxford, Basil Blackwell.

Gluckman, Max., (1965) Politics, Law and Ritual in Tribal Society, Oxford, Basil Blackwell.

Grace,T.H.(1992) Tuwharetoa , Histroy of the Maori People of the Ttaupo District,Auckland, Reed

Lewis, DM., (1997) Indigenous Peoples, Ethnic Groups, and the State, Boston, Allyn & Bacon .Inc.

Mead, S. M. (2003) Tikanga Maori: living by Maori values,

This work is licensed under a Creative Commons Attribution-NonCommercial-NoDerivatives 4.0 International License..

Wellington, N.Z., Huia.

Orbell, Margaret (1991) Hawaiki A new approach to maori Tradition,Cantabary University Press,

Perera, A. (2010) The Fourth World and Sri Lanka –World Indigenous Communities & Vanniyaletto (veddas) of Sri Lanka, An author publication, Bandarawela

Prichard, E. (1992) Social Anthropology (3rdIndian reprint) New Delhi, Universal Book Stall.

Purcell, T.W. (1998) Indigenous knowledge and applied anthropology; Questions of definition and direction, Human Organization, volume 57, November 3/fall, Oklahoma City, The Society for Applied Anthropology.

Redfield, R. (1947) The folk society, American Journal of Sociology, Harcourt, Brace and Co.

Royal, C., (2002) Indigenous Worldviews A Comparative Study, New Zealand, Winston Churchill Memorial Trust.

Seligman, C.G. & Seligman, B. (1993) Veddas, New Delhi, Navrang Publishers.

UNHR, (n. d.) International Decade of the World's Indigenous People United Nations Human Rights, (1995-2004), viewed 2010/02/16

UNPFII ,(2007) United Nations Permanent Forum on Indigenous Issues, Report on the sixth session, Economic and Social Council, Official Records, Supplement No. 23, New York, United Nations.

**Newspaper articles**

Jayatunge, M.R. (2009) The Stolen Generations-Most blemished chapter in Australian history, Ceylon Daily News 11/09/2009

**Magazines**

Venne, Sharon (2011 The road to the united nations and rights of indigenous peoples , Griffith law review vol 20 no 3, Nathan, Griffith University Law School.

**Web sites**

,http://www.ilo.org/indigenous/Conventions/no169/lang--en/index.htm 10/02/16

https://www.ifad.org/documents/10180/cff46e5c-19a6-4077-b1ea-94a83888bfbf ,21,06.2016

http://www.iwgia.org/culture-and-identity/identification-of-indigenous-peoples 16/02/2010

http://siteresources.worldbank.org/INTSAFEPOL/Resources/Indigenous_peoples_review_august_2011.pdf 16/06/2016

http://www.ohchr.org/Documents/Issues/IPeoples/UNDGGuidelines.pdf 25.06.2016

http://www.TeAra.govt.nz/en/biographies/3r4/ratana-tahupotiki-wiremu 25.06.2016

https://www.culturalsurvival.org/publications/cultural-survival-quarterly/united-states/addressing-indigenous-rights-united-nations 30.06.2016

http://www.ohchr.org/EN/Issues/IPeoples/Pages/MandateWGIP.aspx 29.06.2016

https://www.un.org/development/desa/indigenouspeoples/unpfii-sessions-2.html 29.02.2016

http://www.iwgia.org/human-rights/un-mechanisms-and-processes/2nd-un-decade-on-indigenous-peoples 29.02.2016

http://www.globalissues.org/article/693/rights-of-indigenous-people#Indigenouspeoplehaveoftenhadmanyrightsdenied 25.06.2016

http://www.un.org/esa/socdev/unpfii/documents/DRIPS_en.pdf 23.06. 2016

This work is licensed under a Creative Commons Attribution-NonCommercial-NoDerivatives 4.0 International License..